# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
## මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
## தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

105 - 5th Lane, Colomo - 03, Sri Lanka
Tel: +94 11 2564404, Fax: +94 11 4722632
**E-mail:** cmev@cpalanka.org **Website:** http://cmev.wordpress.com


# ඌව පළාත් සභා මැතිවරණය - 2009 අගෝස්තු

මාධ්‍ය නිවේදනය - අංක 02

2009 අගෝස්තු 07 කොළඹදී: 2009 අගෝස්තු 05 වන දින මධ්‍යම රාත්‍රියෙන් අවසන් වූ මැතිවරණ ප්‍රචාරක කාලය තුළ මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියාවන් 44 ක් CMEV වෙත වාර්තා වී ඇත. මෙම සිද්ධීන් අතරින් 22 ක් මොණරාගල දිස්ත්‍රික්කයෙන්ද, සිද්ධීන් 22 ක් බදුල්ල දිස්ත්‍රික්කයෙන්ද වාර්තා වී ඇත. මැතිවරණ ප්‍රචාරක කාලය ආරම්භයේදි සාපේක්ෂක වශයෙන් පැවති සාමකාමි වාතාවරණය එහි අවසාන කාලය තුල ඇති වු සිදුවීම් තුලින් වෙනස් වී ඇති අතර එම තත්වය, අගෝස්තු 08 වන දින පැවැත්වෙන ඡන්ද විමසීමේ නිදහස් හා සාමකාමි පරිසරයට දැඩි බලපෑමක් විය හැකි බව CMEV වෙත නිරීක්ෂණය වි ඇත.

පහරදීම් පොදු දේපල අයථා පරිහරණයන්, තර්ජනය කිරීම් හා ගිනි තැබීම් යන සිද්ධීන් සැළකිය යුතු මට්ටමින් ඉහළ ගොස් ඇත.

බරපතල සිද්ධීන් අතර වැඩිම ගණනක් සිදු වී ඇත්තේ පහරදීම්ය. CMEV වර්තාවලට අනුව මෙම සිද්ධීන්වලට එ.ජ.නි.ස. ආධාරකරුවන් වගඋත්තරකරුවන් වී ඇති බව හඳුනාගෙන ඇත. එකම සන්ධානය තුළ පවතින මනාප තරඟය මේ සඳහා එක් ප්‍රධාන හේතුවක් වී ඇත.

මැතිවරණ නීති උල්ලංඝණයන් හා පොදු දේපල අයථා පරිහරණයන් දිගින් දිගටම සිදුවීමට පොලිසියේ නිසි ක්‍රියාකාරීත්වයක් නොමැතිවීම ද හේතු වී ඇත. සෑම අපේක්ෂකයකුම පාහේ පෝස්ටර් හා විශාල ප්‍රමාණයේ කටවුට් ප්‍රදර්ශනය, රජයේ වාහන භාවිතය, ඡන්ද රැලි හා අනවසර ශබ්දවිකාශන යන්ත්‍ර භාවිතා කිරීම අඛණ්ඩව සිදුවෙමින් පවති.

සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගෙන් CMEV වෙත ලැබුනු තොරතුරු අනුව තාවකාලික හැඳුනුම්පත් 17000 ක් පමණ නිකුත්කර ඇත. මෙම තාවකාලික හැඳුනුම්පත් අතරින් 7000 කට ආසන්න ප්‍රමාණයක් මොනරාගල දිස්ත්‍රික්කයෙන්ද, 10000 කට වඩා වැඩි ප්‍රමාණයක් බදුල්ල දිස්ත්‍රික්කයෙන්ද නිකුත්කර ඇත.

CMEV මේ වන විට එළැඹෙන ජන්ද විමසීම නිරීක්ෂණ සඳහා අදාල මූලික සැලසුම් අවසන් කර ඇති  අතර මැතිවරණ දිනයේදී ස්ථාන නිරීක්ෂකයින් 230 ක් යොදවා ජන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණය කරනු ඇත. එයට අමතරව ජංගම නිරීක්ෂණ කණ්ඩායම් 25 ක් හා ක්ෂේත්‍ර නිරීක්ෂකයන් 15 යොදා ගනිමින් සමස්ත ජන්ද මධ්‍යස්ථාන අතරින් 70% පමණ නිරීක්ෂණය කිරීමට සැලසුම් කර ඇත.

CMEV නිරීක්ෂකයන්ට සිය කාර්යයන් බාධාවකින් තොරව සිදුකිරීමට තවදුරටත් සහයෝගය ලබා දෙන ලෙස සියලු පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටිමු.

මැතිවරණ දිනයේ දි ජන්ද දායකයන්ට, දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වලට ජන්ද විමසීමට අදාල ප්‍රචණ්ඩ ක්‍රියාවන් පහත සඳහන් දුරකථනයන් ඔස්සේ CMEV වෙත වාර්තා කල හැකිය.

දුරකථන අංක

| **ස්ථානය** | **දුරකථන අංක** | **ෆැක්ස් අංකය** |
|---|---|---|
| කොළඹ | 0112 5644404 | 0114722632 |
| ඌව පලාත | 060 2030462 | |
| යාපනය හා වවුනියාව | 011 25621904 | |

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාත සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

| | | |
|---|---|---|
| ආචාර්ය පී සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |